
# සින්වු සහ බින්වු



එල්. කේ. තීක්ෂණ ද සිල්වා

# සින්ටු සහ බින්ටු

එල්. කේ. තීක්ෂණ ද සිල්වා

**සින්ටු සහ බින්ටු**

**කථාව සහ චිත්‍ර**

**එල්. කේ. තීක්ෂණ ද සිල්වා**

**7 ශ්‍රේණිය C**

**කිංස්වුඩ් විද්‍යාලය**

**මහනුවර**

**කතෘගේ වෙනත් කෘති**

**කෘතිය පළ කරන දිනය**

2025 පෙබරවාරි

**ISBN අංකය**

**ISBN – 978-624-208-862-4**

# පිදුම

මහමායා බාලිකා විද්‍යාලයේ ගුරු
විදුහල්පතිතුමියට ,

ඇදුරු මඬුල්ලට හා කිංස්වුඩ්
විදුහලේ විදුහල්පති තුමාට සහ
ඇදුරු මඬුල්ලට

සහ

දයාබර දෙමාපියන්ට
සෙනෙහසින් පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවධර්නය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුගයේ කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වණර්මය අවධිය මෙයයි. දැනට වෂර් ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරධන අත්තදස්සී මා හිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරනයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලයේ මහනුවර

එකමත් එක කාලෙක කැලෑවක් අසල තිබුණු කුඩා ගම්මානෙක හිටියා සින්ටු සහ බින්ටු කියලා ළමයින් දෙන්නෙක්. මේ දෙන්නාගේ පියා කුඩා කාලයේදීම මියගිහින්. සින්ටුයි බින්ටුයි හරිම කරුණාවන්තයි.

එයාලා සතුන්ට ගොඩක් කරුණාව දක්වනවා. ගෙදර අම්මාගේ වැඩ වලට උදව් කරන මේ දෙන්නා ගමේ වැඩිහිටි අයගේ වැඩවලටත් ඉතාමත් උනන්දුවෙන් උදව් කරන නිසා ගමේ හැමෝම මේ දෙන්නාට ගොඩක් ආදරෙයි.

එක දවසක් එයාලට එයාලගේ අම්මා කිව්වා කැලේට ගිහින් දර කඩාගෙන එන්න කියලා. අම්මා කියනදේ ඉතාමත් හොඳින් අසන මේ දෙන්නා දර කඩන්න සතුටින් කැලෑවට ඇතුල් වුණා.



ඉතාමත් රසවත් පලතුරු වලින් පිරුණු මේ කැලෑවේ පලතුරු කඩමින් දෙදෙනා ඉදිරියටම ගමන් කළා. ඉතා ලස්සන කුරුල්ලන් දිහා බලමින් , දියකඩිති වල ඇති මාළුවන් සමග සෙල්ලම් කරමින් කැලේ ඉදිරියටම ඇදුණා.

එයාලා කැලේ දිගේ ටික දුරක් යනකොට මගදී ආච්චි කෙනෙක් මුණ ගැසුණා. ඒ ආච්චි මේ දෙන්නට මෙහෙම කිව්වා.

"අනේ පුතේ මගේ මේ කළේ මගේ ගෙදරට ගිහින් දෙන්නකෝ "

සින්ටුයි බින්ටුයි මේ කළේ ආච්චිගේ ගෙදරටම ගිහින් දුන්නා.



ඔය දෙන්නට ගොඩාක් පිං පුතේ කියලා ආච්චි කිව්වා. ආච්චි මේ දෙන්නට මායා වංගෙඩියක් දුන්නා. මේ වංගෙඩිය කරකවන කොට බනිස් , චොක්ලට් , පාන් , බිස්කට් වගේ කෑම ගොඩක් වැටෙන්න පටන් ගත්තා. මේ දෙන්නා ආච්චිට ස්තූති කරලා, අම්මාට දර මිටියකුත් බැඳගෙන, වංගෙඩියත් අරගෙන ගෙදර ගියා.

ගෙදර ගිහින් අම්මට කතා කරලා අපිට හම්බවුණ මේ දේ බලන්න ඉක්මනින්ම එන්න කිව්වා. අම්මා ඇවිත් බැලුවා.



"මේ වංගෙඩියක්නෙ පුතේ "

අම්මා කිව්වා.

"ඔව් අම්මේ,මේක වංගෙඩියක් උනාට

කරකවන කොට මේකෙන් බිස්කට් ,

බනිස් ,පාන් ,අයිස් ක්‍රීම්, ටොෆි

,චොක්ලට් වගේ ගොඩක් දේවල්

වැටෙනවා " සින්තු කිව්වා.



ගමේ සිටින දුප්පත් ළමයින්ට හා අසරණ මිනිසුන්ට මේ වංගෙඩියෙන් වැටෙන කෑම සින්ටුයි බින්ටුයි සතුටින් බෙදලා දුන්නා. ටික දවසක් යනකොට මේ ගැන ගමේ ගම්මුලාදෑනියාට ආරංචි වුණා. ගම්මුලාදෑනියා ඉතා නපුරු කපටියෙක්. මොහු ඔහුගේ සේවකයෝ දෙතුන් දෙනෙකු සමග සින්ටු බින්ටුලාගේ ගෙදරට ආවා. සින්ටුයි බින්ටුයි අඬද්දී ගල් වංගෙඩිය අරගෙන යන්න ගියා.

ගම්මුලාදෑනියා මේ පුදුම ගල් වංගෙඩියෙන් වැටෙන කෑම මුදලට මිනිසුන්ට විකුණන්න පටන් ගත්තා.

ගමේ මිනිසුන්ටත් ගම්මුලාදෑනියා කරන මේ නොහොබිනා දේ ගැන හරිම තරහයි. ඒ වගේම දුකයි. ගම්මු එකතුවෙලා මේ ගැන රටේ රජතුමාට කිව්වා.

රජතුමා රාජපුරුෂයෝ යවා ගල්වංගෙඩිය සහ ගම්මුලාදෑනියා රජවාසලට ගෙන්වා ගත්තා.මේ කළ වැරැද්දට ගම්මුලාදෑනියා සිර භාරයට පත් කළා. නැවතත් ගල් වංගෙඩිය රජ පෙරහරකින් සින්ටු සහ බිංදුගේ ගෙදරට රැගෙන ගියා.

ගම්වාසින්ට හරිම සතුටුයි. පුංචි දරු දෙදෙනාටත් හරිම සතුටුයි. සතුටට පත් ගමේ මිනිස්සු දරුවෝ දෙන්නා ඔසවාගෙන ගී කියමින් නැටුවා. නැවතත් සින්ටුයි බින්ටුයි ගමේ දුප්පත් මිනිසුන්ට කෑම බෙදා දෙන්න පටන් ගත්තා. එයින් පසු ගමේ මිනිස්සුන්ට කෑමෙන් බීමෙන් කිසිදු අඟ හිඟකමක් ඇතිවුණේ නෑ. හැමෝම බොහොම සතුටින් ජීවත් වුණා.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතුව 2014 පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පයේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනය ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප පළාත් ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසය එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපයාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පයේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියමක් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාටර් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයින් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාව ගොඩ නගා දී තිබේ. එම නිසා සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂින්සන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනවිරත්න මහ ලේකම්